සන්නස SANNASA

# ලියා දන්වන වග

## විප්‍රවාසී සාහිත්‍ය ප්‍රබෝධය

ඔස්ට්‍රේලියාවේ විවිධ නගර කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක වන ලේඛක ලේඛිකාවන් ගේ එකතුවෙන් බිහිවන සාහිත්‍ය නිර්මාණ දැකීම සතුටට කාරණයකි. සිඩ්නි ලේඛක සංසදයෙන් "ඔසී රටේ අපේ කතා" නමින් කෙටිකතා සංග්‍රහයක් එළිදැක්වෙද්දී ඒ සමගාමීව ප්‍රවීණ ලේඛිකා ස්වර්ණකාන්ති රාජපක්ෂ ගේ සංස්කරණයෙන් "කූඩු කිරිල්ලී" නමින් තවත් කෙටිකතා සංග්‍රහයක් බිහිවීම විගාමික සිංහල සාහිත්‍යයේ ප්‍රබෝධය අපේක්ෂා කරන්නවුන් අගය කරන කාරණාවක් වීම නොවැළැක්විය හැකිය.

ශ්‍රී ලංකාවේ සිට විදෙස් රට වලට සංක්‍රමණය වන්නන් තුළින් මව් බස පිළිබඳ තිබෙන බැඳියාව අඩුවෙන්නේ ය යන මිත්‍යාව බිඳ වැටෙන්නේ මෙවන් නිර්මාණ දකින විට ය.

බොහෝ අපහසුකම් මැද මෙවන් නිර්මාණ කාර්යයන්හි නිරත වන අපේ ලේඛක ලේඛිකාවන් දිරි ගැන්වීම සමාජයේ වගකීමක් වෙයි. ඒ වගකීම නිසියාකාරයෙන් ඉටු වන්නේ නම් තව තවත් මෙවන් නිර්මාණ කියවන්නට අපට හැකි වනු ඇත යන්න අපේ විශ්වාසයයි.

**සංස්කරණය / Editors**
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe
editor@sannasa.com.au
අසෝක සුබසිංහ Asoka Subasinghe

**සහය සංස්කරණය / Asst Editor**
අසෝක සිල්වා Asoka Silva

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by CrystAl D** | DigitAl Agency
www.crystAld.com.au

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සාලිය ගලප්පත්ති
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account DetAils**
**Acc Name:** Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.

# මෛත්‍රීපාල පඹයෙක්ද ?



### පුද්ගල පෞර්ෂයේ ප්‍රශ්නයක් ද ධුරයේ ස්වභාවය ද

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා ඉතාමත්ම දුර්වල පුද්ගලයෙකු බවට ප්‍රචලිත අදහසක් තිබේ. එය කොතෙක් පොදු පිළිගැනීමකට ලක්ව තිබේදැයි කිවහොත්, ජනාධිපතිවරයාම කිහිප අවස්ථාවකදී එබඳු අදහසක් සමාජයේ පවතින බව පවසා සිටියේය. මෙතරම් බලගතු ධුරයක් හිමිව තිබෙත්දීත් එහි බලය පාවිච්චි කරන්නට නොහැකිව සිටින ඔහු දෙස බොහෝ අය අවඥාවෙන් බලන අතර, මීට පෙර සිටි ජනාධිපතිවරු කොතෙක් තේජාන්විතව, බලවත්ව සිටියේදැයි අපට මතක් කර දෙති. මෛත්‍රීපාල සිරිසේන මහතා මෙසේ දුර්වලව සිටින්නේ ඔහුගේ පුද්ගලික දුර්වලතාවක් නිසාද? නොඑසේනම්, ඔහු වෙනුවට මේ මොහොතේ ජනාධිපතිව සිටියේ ජේ. ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස හෝ මහින්ද රාජපක්ෂ නම් ඔවුන් බලවත්ව සිටිනු ඇත්ද? පිළිතුර නැත යන්නයි. ප්‍රචලිත අදහස කුමක් වුවත්, මේ දක්නට ලැබෙන්නේ මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පුද්ගලික දුර්වලතාවක් නොව, ලංකාවේ දැනට ක්‍රියාත්මක විධායක යැයි කියන, අතිශය බලසම්පන්න යැයි කියන ජනාධිපති ධුරයේ ඇත්ත තත්ත්වයයි.

1978 ආණ්ඩුක්‍රමය මගින් ඇතිකරන ලද්දේ විධායක ජනාධිපති ක්‍රමයක් නොව අර්ධ ජනාධිපති හෙවත් මිශ්‍ර ක්‍රමයක් බව දැනට සිය වතාවකටත් වඩා කියා ඇත. මෙය පාර්ලි මේන්තු හෙවත් කැබිනට් ක්‍රමයේත්, ජනාධිපති ක්‍රමයේත් මිශ්‍රණයකි. විධායකයේ නායකයා වන ජනාධිපතිවරයා, ඒ සඳහාම වූ මැතිවරණයක් වන ජනාධිපතිවරණයකින්, ජනතාව විසින් සෘජුවම තෝරා පත්කර ගත්තත්, විධායකය සම්පූර්ණ වීමට කැබිනට් මණ්ඩලයකුත් අවශ්‍යය. කැබිනට් මණ්ඩලය පත්වන්නේ පාර්ලිමේන්තුවේ බහුතර බලය හිමි කණ්ඩායමෙ නි. මේ ක්‍රමයේදී ආණ්ඩුව පත්වන්නේ එසේය. සාමාන්‍යයෙන්, හැමවිටම පාහේ ජනාධිපති වරණයක් පවත්වා ඒ සමගම මහා මැතිවරණයක් පවත්වන බැවින්, ජනාධිපතිවරයා පත්වන පක්ෂයට හෝ එය අයත් සන්ධානයට පාර්ලිමේන්තුවේ බලයද හිමිවේ. ඒ අනුව විධායකය සම්පූර්ණ වන්නේ එකම පක්ෂයක ජනාධිපතිවරයෙකුගෙන් සහ කැබිනට් මණ්ඩලයකිනි. වෙනත් අයුරකින් කිවහොත් ජනාධිපතිවරයා යනු අන් කවරෙකුවත් නොව, පාර්ලිමේන්තුවේ බහුතර බලය හිමි පක්ෂයේ හෝ සන්ධානයේ නායකයාය. එම පක්ෂ සම්බන්ධය නිසා පාර්ලි මේන්තුවේ එම බහුතර කණ්ඩායම හෝ කැබිනට් මණ්ඩලය, ජනාධිපතිවරයාට එරෙහිව යන්නේ හෝ ඔහු සමග ගැටෙන්නට යන්නේ නැත. ඒ අනුව පාර්ලිමේන්තුව වෙත පැවරෙන බලයක් වෙතත් එයත් තම මනාපයට භාවිත කරමින් ජනාධිපතිවරයා තමන්ට අවශ්‍ය ලෙස පාලනය ගෙන යයි.

මේ හා සම්බන්ධයෙන් යම් උත්ප්‍රාසයක් ගොඩ නැගීමට කැමැත්තෙමි. එනම්, පවත්නා ආණ්ඩුක්‍රමය තුළදී ජනාධිපතිවරයා බලවත්ව ඇත්තේ ඇත්තෙන්ම ඔහුට එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ලැබෙන බලයට වඩා තම පක්ෂය තුළ ඔහු නායකයා වීම මගින් ලැබෙන බලය නිසාය යන්නයි. ලංකාවේ කිසිදු පක්ෂයක ව්‍යවස්ථාවක්, ලංකාවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී යයි කියන ආණ්ඩුක්‍රම විය ව්‍යවස්ථාව තරම්වත් ප්‍රජාතන්ත්‍රවාදී නැත. ඒ අනුව, පක්ෂයක නායකයා ඉවත් කිරීම තබා ඔහුගේ මතයකට එරෙහිව යාමවත් ඇත්තෙන්ම නම් කළ නොහැකි දෙයකි. ලංකාවේ ජනාධිපතිවරු බලවත් වූයේ ඔවුන්ට තම පක්ෂ තම රිසි පරිදි පාලනය කිරීමට හැකිවීම නිසා මිස ජනාධිපති ධුරය මගින් අසහාය බලයක් ලබා දීම නිසා නොවේ. ජනාධිපති ක්‍රමයට යම් හෝ විවේචනයක් කළ හැකි නම් ඒ, එම පක්ෂ නායක ධුරය ස්ථාවර කර ගැනීම සඳහා ජනාධිපති ධුරයේ බලයත් භාවිත කරන්නේය කියා පමණකි. කිසිදු දිනක ජනාධිපති නොවූ රනිල් වික්‍රමසිංහ මහතා, ජනාධිපතිවරු තිදෙනෙකුට මුහුණ දෙමින්, වසර විසි හතරක් පුරා තම පක්ෂ නායකත්වය ආරක්ෂා කර ගැනීමට සමත් වීමෙන් පෙනී යන්නේ එම විවේචනයද එතරම්ම ශක්තිමත් එකක් නොවන බවයි.

ජනාධිපතිධුරය කෙතරම් දුර්වල, බල විරහිත එකක්ද යන්න තේරුම් ගැනීමට නම්, ජනාධිපතිවරයාට පාර්ලිමේන්තු බලය අහිමි විය යුතුය. චන්ද්‍රිකා කුමාරතුංග ජනාධිපති වරියට 2001 වර්ෂය අගදී එය සිදුවිය. රනිල් වික්‍රමසිංහ මහතාගේ එක්සත් ජාතික පක්ෂය මහමැතිවරණය ජය ගැනීම නිසා ඔහුට පාර්ලිමේන්තුවේ බහුතර බලය හිමි විය. එසේ පාර්ලිමේන්තු බලය අහිමි වීම නිසා චන්ද්‍රිකාට මුහුණ දෙන්නට සිදුවූ සෝචනීය තත්ත්වය තේරුම් ගැනීමට හොඳම සාක්ෂිය වන්නේ එස්. බී. දිසානායක මහතාගේ ඇමති ධුරය පිළිබඳ ප්‍රශ්නයයි. ඒ වනවිට චන්ද්‍රිකා සහ එස්. බී. අතර ඉතාමත්ම වෛරසහගත තත්වයක් ඇති වී තිබුණි. එස්. බී. ට තමන්ගේ ප්‍රියතම වූ සමෘද්ධි ඇමතිකම අවශ්‍ය වූ අතර, චන්ද්‍රිකා එය කිසිසේත්ම ඔහුට නොදෙන ස්ථාවරයක සිටියාය. නමුත් අවසානයේ සිදු වූයේ අසීමිත බලයක් ඇතැයි කියන විධායක ජනාධිපතිනියට, තමන්ගේ පරම වෛරක්කාරයා වූ එස්. බී. ට ඔහු කැමති ඇමති ධුරය පිරිනමන්නටයි. චන්ද්‍රිකා අප්පිරියාවෙන් සහ කෝපයෙන් ඉවත බලාගෙන සිටියදී එස්. බී. ඇය ඉදිරියේ ජයග්‍රාහීව දිවුරුම් දෙන ඡායාරූපය ඔය කියන විධායක ජනාධිපතිට පාර්ලිමේන්තු බලය අහිමි වූ විට කෙතරම් අසරණ වන්නට සිදු වන්නේද යන්නට කදිම ශාක්ෂියකි.

වත්මන් ජනාධිපතිවරයා දුර්වලව සිටින්නේ ඔහු ගැමි පසුබිමකින් පැමිණි, ඉංග්‍රීසි බැරි, හිටපු ග්‍රාම නිලධාරියෙකු වීම නිසා යැයි සමහරු අපහාසාත්මකව තර්ක කරති. එය එසේනම් ඔවුන් රදළ, ඉංග්‍රීසි බසෙහි චතුර, දෙමව්පියන් දෙදෙනාම අගමැතිවරුන් වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග, මෛත්‍රීපාල සිරිසේනට සමාන සමාජ පසුබිමකින් පැමිණි, එස්. බී. ඉදිරියේ දන නැවීම ගැන කියන්නේ කුමක්ද? මේ ඇත්තේ පුද්ගල පෞර්ෂයේ ප්‍රශ්නයක් නොව, මේ ධුරයේ ස්වභාවය පිළිබඳ ප්‍රශ්නයකි. මෛත්‍රීපාල වෙනුවට ජේ. ආර්., ප්‍රේමදාස හෝ මහින්ද රාජපක්ෂ නොව ගෝඨාභය නැතිනම් හිට්ලර් හිටියත් ඔයිට වඩා දෙයක් කරන්නට නොහැකිය. මේ ධුරයට නිසඟ බලයක් නැත. ඔය ධුරය අහෝසි කිරීමෙන් අමුතු ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති වෙන්නේ නැති බව අප කියන්නේ එනිසාය.

*අනිද්දා පුවත්පතට ලියන ලද ලිපියකි*

**කථිකාචාර්ය**
**අනුරුද්ධ ප්‍රදීප් කර්ණසූරිය**